සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

0900

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

කෘෂි තාක්ෂණවේදය I
விவசாயத் தொழினுட்பவியல் I
Agro Technology I

18 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two hours

වැදගත් :

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු **නොලැබේ.**
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. ජෛව හායනයට ලක් **නො වන** අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වඩාත් ම උචිත විසඳුම වනුයේ
   (1) ගබඩා කිරීම ය. (2) වැලලීම ය. (3) පිළිස්සීම ය. (4) ඉවත දැමීම ය. (5) ප්‍රතිචක්‍රීකරණය ය.

2. එළවළුවල පසු අස්වනු හානිය අවම කළ හැක්කේ
   (1) මධ්‍යාහ්නයට පෙර නෙළා ගැනීමෙනි.
   (2) අස්වනු නෙලූ වහා ම ගබඩා කිරීමෙනි.
   (3) දෙමුහුන් බීජ පමණක් වගා කිරීමෙනි.
   (4) පාරම්පරික සැකසීම් ක්‍රම මගිනි.
   (5) ක්ෂේත්‍රයේ දී පළිබෝධ හානි අවම කර ගැනීමෙනි.

3. පටක රෝපණයේ දී බහුල ව භාවිත කරනු ලබන අර්ධ-ඝණ රෝපණ මාධ්‍යය වනුයේ
   (1) ඒගාර් මාධ්‍යය ය.
   (2) මිලර් මාධ්‍යය ය.
   (3) අර්තාපල් පිෂ්ට මාධ්‍යය ය.
   (4) සෝඩියම් හයිපොක්ලෝරයිට් මාධ්‍යය ය.
   (5) මුරශිගේ සහ ස්කුග් මාධ්‍යය ය.

4. ආහාරවල මුඩු රසය වර්ධනය විය හැක්කේ
   (1) ලැක්ටේස්වල ක්‍රියාකාරිත්වය නිසා ය.
   (2) කැටලේස්වල ක්‍රියාකාරිත්වය නිසා ය.
   (3) පෙක්ටිනේස්වල ක්‍රියාකාරිත්වය නිසා ය.
   (4) පෙරොක්සිඩේස්වල ක්‍රියාකාරිත්වය නිසා ය.
   (5) පොලිෆීනෝල් ඔක්සිඩේස්වල ක්‍රියාකාරිත්වය නිසා ය.

5. ආහාරය මගින් ශරීරයට අවශ්‍ය ප්‍රමාණයට යකඩ **නො ලැබීමෙන්** ඇතිවිය හැක්කේ
   (1) ගලගණ්ඩය ය.
   (2) රක්තහීනතාව ය.
   (3) චර්ම කුෂ්ඨ ය.
   (4) ඇස්පෙනීමේ දුර්වලතා ය.
   (5) අජීර්ණය ය.

6. 'යෝග' යන වචනයෙන් අර්ථවත් වන්නේ
   (1) හිරු, සඳු සහ පොළොවේ එකතුව ය.
   (2) හිත, කය සහ ආත්මයේ එකතුව ය.
   (3) සෞඛ්‍යය, අධ්‍යාත්මය සහ ශරීරයේ එකතුව ය.
   (4) ශක්තිය, පදාර්ථය සහ ආත්මයේ එකතුව ය.
   (5) සීල, සමාධි සහ ප්‍රඥාහි එකතුව ය.

7. කෘෂිකාර්මික ව්‍යවසායකයකුට අන්තර්ජාලය හරහා වෙනත් රටක සිටින ගැනුම්කරුවකු සමඟ අන්තර්ක්‍රියාකාරී ව අදහස් හුවමාරුකර ගැනීමට උපකාරීවන ක්‍රමය වනුයේ
   (1) ටෙලෙක්ස් ය.
   (2) ස්කයිප් ය.
   (3) විද්‍යුත් තැපැල ය.
   (4) ෆැක්ස් ය.
   (5) කෙටි පණිවුඩ සේවාව ය.

8. ශ්‍රී ලංකාවේ බහුලව ම පැතිරී පවතින පස් වර්ගය වනුයේ
   (1) ඇලූවියල් පස ය.
   (2) හියුමික් අඩු ග්ලේ පස ය.
   (3) කැල්සික් **නො වන** දුඹුරු පස ය.
   (4) රතු දුඹුරු පස ය.
   (5) රතු දුඹුරු ලැටසෝල් පස ය.

9. ධාන්‍ය බීජවල දක්නට ලැබෙන බීජ ප්‍රරෝහණය ඇරඹීමට උපකාරී වන ප්‍රධාන ජලවිච්ඡේදන එන්සයිමය වනුයේ
   (1) ඇමයිලෝස් ය.
   (2) ප්‍රෝටියේස් ය.
   (3) සයිටොකයනින් ය.
   (4) ගිබරලින් ය.
   (5) ඇල්ෆා-ඇමයිලේස් ය.

[දෙවෙනි පිටුව බලන්න.

10. රසායනික ව සල්ෆර් සංස්ලේෂණය කරන්නා වූ බැක්ටීරියා දැකිය හැක්කේ
(1) කොරල් පරවල ය. (2) කලපුවල ය. (3) ගංමෝයවල ය.
(4) ලවණ වගුරුවල ය. (5) උණු දිය මංකඩවල ය.

11. ව්‍යාපාරයක දී කාරක ප්‍රාග්ධනය වැදගත් වනුයේ
(1) කාර්ය මණ්ඩලයේ පුහුණුවීම් සඳහා වන වියදම් පියවීමට ය.
(2) යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් සඳහා වන වියදම් පියවීමට ය.
(3) අමුද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වන වියදම් පියවීමට ය.
(4) ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා වන වියදම් පියවීමට ය.
(5) යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන වියදම් පියවීමට ය.

12. දක්ෂ ව්‍යවසායකයකු
(1) කිසි විටෙකත් අවදානම් **නො ගනී.**
(2) අවදානම් ගනු ලබන්නේ තීරණාත්මක අවස්ථාවල දී පමණි.
(3) සිය අභිමතාර්ථ ළඟාකර ගැනීමට සැමවිටම ඕනෑම අවදානමක් ගනු ලබයි.
(4) ව්‍යාපාරය ආරම්භයේ දී පමණක් අවදානම් ගනු ලබයි.
(5) අවදානම් සැලකිල්ලට භාජනය කරන අතර අවදානම් පාලනය කර ගැනීමට පියවර ගනී.

13. මනා ලෙස කළමනාකරණය **නො කළහොත්** පෘථිවිය දූෂණය විය හැකි හා ජෛව හායනයට ලක් **නො වන** අපද්‍රව්‍යයක් සඳහා උදාහරණයක් වනුයේ
(1) ද්‍රවිතෙල් ය. (2) රසායනික පොහොර ය.
(3) කෘමිනාශක බහාලුම් ය. (4) විකිරණශීලී ද්‍රව්‍ය ය.
(5) ඕගැනොපොස්පේට් අඩංගු පළිබෝධනාශක ය.

14. දියවැඩියාව ඇති රෝගියකු අනුගමනය කළ යුතු යහපත් ආහාර පුරුද්දක් සඳහා උදාහරණයක් වනුයේ
(1) පාහින ලද සහල් පරිභෝජනය කිරීම ය.
(2) තම්බන ලද කැරට් සහ බීට් පරිභෝජනය කිරීම ය.
(3) ආහාර වේලක ඇති තන්තුමය ආහාර ප්‍රමාණය වැඩිකිරීම ය.
(4) ආහාර වේලක ඇති පළා කොළ ප්‍රමාණය අඩුකිරීම ය.
(5) සාමාන්‍ය සීනි වෙනුවට ෆ්‍රක්ටෝස් සීනි භාවිත කිරීම ය.

15. දුර්වල සනීපාරක්ෂක තත්ත්වයන් යටතේ මස් ගබඩා කිරීම නිසා ආහාර විෂවීම සිදුවිය හැකි ය. මේ තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවන ක්ෂුද්‍රජීවියා වනුයේ
(1) *Aspergillus flavus.* (2) *Penicilium roqufoorti.*
(3) *Clostridium botulinum.* (4) *Lactobacillus bulgaricus.*
(5) *Lactobacillus thermophilus*

16. රටක ආහාර සුරක්ෂිතතාව
A - කෙරෙහි රජයේ ආහාර ආනයන-අපනයන ප්‍රතිපත්ති මගින් බලපෑම් ඇතිවිය හැකි ය.
B - සුදුසු පසු අස්වනු තාක්ෂණ භාවිත කිරීමෙන් ශක්තිමත් කළ හැකි ය.
C - රටේ ජනගහනය සමඟ සම්බන්ධතාවක් **නො මැත.**
D - ගෘහාශ්‍රිත ආහාර සුලබතාව වැඩිකිරීම කෙරෙහි බලපෑමක් ඇති **නො කරයි.**

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ
(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) A, B සහ C පමණි.
(4) A, C සහ D පමණි. (5) B, C සහ D පමණි.

17. ශ්‍රී ලංකාවේ දේශගුණය සහ කෘෂි-දේශගුණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ
(1) කෘෂි පාරිසරික කලාප 44 ක් ඇත.
(2) ඊසාන දිග මෝසම මැයි මාසය මුල දී ආරම්භ වේ.
(3) පළමු අන්තර් මෝසම මාර්තු සහ අප්‍රේල් මාසවල පවතී.
(4) යල කන්නය වාර්ෂික බෝගවල ප්‍රධාන වගා කන්නය වේ.
(5) දේශගුණික කලාප වෙන්කර ඇත්තේ වර්ෂාපතනය සහ පාංශු වර්ගය අනුව ය.

18. බීජ සුප්තතාව
(1) යනු ජීවතාවය පවත්වාගෙන යාම සඳහා බීජතුළ දක්නට ලැබෙන තාක්ෂණයකි.
(2) ඇතිවන්නේ ඝන බීජ ආවරණය සහ අපාරගම්‍ය සෛල පටල නිසා ය.
(3) ජලය වාෂ්පවීම අඩුකර ගැනීම සඳහා ජීව්‍ය බීජ යොදාගන්නා තාක්ෂණයකි.
(4) යනු ප්‍රරෝහණයට හිතකර සාධක සපයා තිබියදීත් ජීව්‍ය බීජ ප්‍රරෝහණය **නො වීම** ය.
(5) යනු ප්‍රරෝහණයට හිතකර සාධක සපයා තිබියදී පමණක් ජීව්‍ය බීජ ප්‍රරෝහණය වීම ය.

[තුන්වෙනි පිටුව බලන්න.

● පහත සඳහන් වනුයේ ආයුර්වේද වෛද්‍යවරයකුගේ ඖෂධ වත්තක ඇති ඖෂධ පැළවල නම් කිහිපයකි. ප්‍රශ්න අංක **19** සහ **20** සඳහා පිළිතුරු සැපයීමට පහත නම් භාවිත කරන්න.

A - අක්කපාන (*Kalanchoe pinnata*)
B - එරබදු (*Erythrina variegata*)
C - ගොටුකොළ (*Centella asiatica*)
D - පොල්පලා (*Aerva lanata*)
E - රණවරා (*Cassia auriculata*)
F - වැල් පෙනෙල (*Cardiospermum halicacabum*)

19. ඖෂධීය තේ නිෂ්පාදනය සඳහා බහුල ලෙස යොදු ගනුයේ,
(1) A, B සහ D පමණි.
(2) A, B සහ F පමණි.
(3) B, C සහ E පමණි.
(4) C, D සහ E පමණි.
(5) D, E සහ F පමණි.

20. කොළ කැඳ නිෂ්පාදනය සඳහා බහුල ලෙස යොදු ගනුයේ,
(1) A, B සහ D පමණි.
(2) A, B සහ F පමණි.
(3) B, C සහ E පමණි.
(4) C, D සහ F පමණි.
(5) D, E සහ F පමණි.

21. ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා ඖෂධ උයනකට ගිය ශිෂ්‍යයකු, උයන්පල්ලා විසින් ලපටි සඳුන් ශාක අවට වල් මර්දනය කර **නැති** බව නිරීක්ෂණය කරන ලදි. මෙසේ වල් මර්දනය **නො කිරීමට** ප්‍රධාන හේතුව විය හැක්කේ,
(1) ලපටි සඳුන් ශාක වල් අතර වර්ධනයට කැමැත්තක් දක්වන නිසා ය.
(2) පාංශු ජල සංරක්ෂණය කිරීමට සජීවී වසුනක් ලෙස වල්පැළ භාවිත කරන නිසා ය.
(3) ලපටි සඳුන් ශාක වල්පැළෑටිවලින් වෙන් කොට හඳුනාගැනීම අපහසු නිසා ය.
(4) උයන්පල්ලා හට වල් මර්දනයට අවශ්‍ය තරම් සේවක පිරිස **නො මැති** නිසා ය.
(5) වල්නාශක යෙදීම ඖෂධ උයන්වල තහනම් කර ඇති නිසා ය.

22. පොල්තෙල් මුඩු බවට සහ පලතුරුවල කැපුම්තලය දුඹුරු පැහැයට හැරෙන බව ශිෂ්‍යයකු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙයට ප්‍රධාන හේතුව වන්නේ
(1) භෞතික සාධක ය.
(2) රසායනික සාධක ය.
(3) ජෛව විද්‍යාත්මක සාධක ය.
(4) රසායනික හා භෞතික සාධක ය.
(5) භෞතික සහ ජෛව විද්‍යාත්මක සාධක ය.

23. නියෝලිතික කාලපරිච්ඡේදයේ දී පුරාණ මිනිසා ඔහුට ප්‍රියජනක පලතුරු ඇති ගස් වලින් නැවත නැවත පලතුරු එකතු කිරීමට උගත්තේ ය. ඊළඟට ඔවුහු, එලෙස තෝරාගත් ශාකවලින් ලබා ගත් බීජ ආසන්න වටපිටාවේ රෝපණය කළහ. මෙම ක්‍රියාවලිය ශාක
(1) අභිජනනයේ ආරම්භය වේ.
(2) ප්‍රචාරණයේ ආරම්භය වේ.
(3) දෙමුහුම්කරණයේ ආරම්භය වේ.
(4) ගෘහස්ථකරණයේ ආරම්භය වේ.
(5) පරිසරයට හුරු කිරීමේ ආරම්භය වේ.

● මිනිසෙකුගේ ගති ලක්ෂණ සමහරක් පහත දක් වේ. මේ ආශ්‍රයෙන් ප්‍රශ්න අංක **24** සහ **25** සඳහා පිළිතුරු සපයන්න.

A - ඉලක්ක ළඟා කරගැනීමට වාසනාව මත පදනම් වී සිටියි.
B - ඔහු ආරම්භ කළ ඕනෑම ව්‍යාපාරයක් සාර්ථක කර ගැනීමට සෑම ප්‍රයත්නයක් ම දරයි.
C - අලාභයක් සිදුවිය හැකි කිසිදු දෙයක් **නො කරයි.**
D - සියලු ම දේ ඔහුගේ උපදෙස් මත ම සිදුවිය යුතු බව විශ්වාස කරයි.
E - යම් කාර්යයක් ආරම්භ කිරීමට ප්‍රථම එහි දීර්ඝ කාලීන ප්‍රතිඵල ගැන සිතා බලයි.
F - අසාර්ථක වුවත් දරන ලද උත්සාහයන්ගෙන් පාඩම් ඉගෙන ගනියි.

24. ඉහත ලක්ෂණ අතුරෙන්, ව්‍යවසායක පෞරුෂයක ගතිගුණ වනුයේ
(1) A, B සහ D පමණි.
(2) A, B සහ E පමණි.
(3) A, C සහ D පමණි.
(4) B, E සහ F පමණි.
(5) C, E සහ F පමණි.

25. ඉහත ලක්ෂණ අතුරෙන්, ව්‍යවසායක **නො වන** පෞරුෂයක ගතිගුණ වන්නේ,
(1) A, B සහ D පමණි.
(2) A, B සහ E පමණි.
(3) A, C සහ D පමණි.
(4) B, E සහ F පමණි.
(5) C, E සහ F පමණි.

- පහත රූපසටහනේ දැක්වෙන අතින් ක්‍රියාකරවන බටර් මත්ගෑමේ උපකරණය (butter churn) ආධාරයෙන් ප්‍රශ්න අංක 26 ට පිළිතුරු සපයන්න.



26. ඉහත උපකරණය වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ
(1) නැනෝ තාක්ෂණයට උදාහරණයක් ලෙස ය.
(2) ඩිජිටල් තාක්ෂණයට උදාහරණයක් ලෙස ය.
(3) නවීන තාක්ෂණයට උදාහරණයක් ලෙස ය.
(4) සාම්ප්‍රදායික තාක්ෂණයට උදාහරණයක් ලෙස ය.
(5) උචිත තාක්ෂණයට උදාහරණයක් ලෙස ය.

27. පෙට්‍රල් එන්ජිමක එක් සිලින්ඩරයක පීඩනය සම්මත අගයට වඩා බෙහෙවින් අඩු බව දැනගත් යාන්ත්‍රිකයකු විසින් එම සිලින්ඩරය ඝන ලිහිසි තෙල්වලින් ස්නේහනය කොට නැවතත් පීඩන පරීක්ෂාව සිදු කරන ලදී. මෙහි දී එම සිලින්ඩරයේ පීඩනය, සම්මත අගයට ආසන්න බව ඔහු නිරීක්ෂණය කළේය. මෙයින් එළැඹිය හැකි හොඳ ම නිගමනය වනුයේ
(1) සිලින්ඩර හිස පුපුරා ඇති බව ය.
(2) චූෂණ වැල්වය විවෘත ව සිර වී ඇති බව ය.
(3) පිටාර වැල්වය විවෘත ව සිර වී ඇති බව ය.
(4) පිස්ටන් මුදු ගෙවී ගොස් ඇති බව ය.
(5) පිස්ටනය සිලින්ඩරය තුළට නිසියාකාර ව ඇතුළු **නො වන** බව ය.

28. ලොව පුරා ජලය වැඩිපුර ම භාවිත වනුයේ
(1) කර්මාන්ත සඳහා ය.
(2) වාරි ජලය ලෙස ය.
(3) මහජන භාවිතයට ය.
(4) සතුන්ගේ භාවිතයට ය.
(5) විදුලිය නිපදවීමට ය.

29. මතුපිට පස සෝදායාම අවම කිරීමට උපකාරීවන ගොවිපළ ක්‍රියාකාරකමක් වන්නේ
(1) සමෝච්ච රේඛාවලට සමාන්තරව සී සෑමය.
(2) පර්යන්තයේ සිට මධ්‍යයට සී සෑමය.
(3) මධ්‍යයේ සිට අරීය ව සී සෑමය.
(4) සමෝච්ච රේඛාවලට ලම්බකව සී සෑමය.
(5) ජලය ගලායන දිශාවට සී සෑමය.

30. ගොවිතැන් කටයුතුවල දී බර කෘෂි යන්ත්‍රෝපකරණ භාවිතය
(1) පාංශු බාදනයට හේතු වේ.
(2) පාංශු සුසංහනයට හේතු වේ.
(3) පාංශු ජලය ක්ෂය වීමට හේතු වේ.
(4) පාංශු කාබනික ද්‍රව්‍ය අඩුවීමට හේතු වේ.
(5) කෘෂි රසායන සහ පොහොර පාංශු ජලයට ක්ෂීරණය වීමට හේතු වේ.

31. ජලය ඉතිමේ වේගයට වැඩි වේගයකින් ළිඳකින් ජලය පොම්ප කිරීමෙන්
A - භූ ජල මට්ටම පහළ යයි.
B - කෝණාකාර අවපාතයක් ඇති කරයි.
C - ළිඳ සිඳී යයි.
D - ළිඳේ ඉවුරු කැඩී යයි.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය වනුයේ
(1) A, B සහ C පමණි.
(2) A, B සහ D පමණි.
(3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම ය.

32. පහත සඳහන් වාරි ක්‍රමවලින් වඩාත් ම ජල සංරක්ෂිත වාරි ක්‍රමය වන්නේ
(1) බිංදු ජල සම්පාදනය ය.
(2) බේසම් ජල සම්පාදනය ය.
(3) පිටාර ජල සම්පාදනය ය.
(4) ඇලි සහ වැටි ජල සම්පාදනය ය.
(5) විසිරි ජල සම්පාදනය ය.

33. පොදුවේ ගත් කළ, ගංවතුර ඇතිවීමේ සම්භාවිතාව අඩු වන්නේ
(1) අපධාවය වැඩිවන විට ය.
(2) ඇතුල් කාන්දුව වැඩිවන විට ය.
(3) උෂ්ණත්වය වැඩිවන විට ය.
(4) වර්ෂාපතනය වැඩි වන විට ය.
(5) සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩිවන විට ය.

[පස්වෙනි පිටුව බලන්න.

34. ක්ෂුද්‍ර පෝෂකයකට උදාහරණයක් වන්නේ
(1) සල්ෆර් ය. (2) කැල්සියම් ය. (3) නයිට්‍රජන් ය. (4) පොටෑසියම් ය. (5) මැන්ගනීස් ය.

35. ADP සහ ATP වල සංඝටකයක් ලෙස වැදගත්වන මූලද්‍රව්‍ය වනුයේ
(1) ක්ලෝරීන් ය. (2) පොටෑසියම් ය. (3) මැංගනීස් ය. (4) මැග්නීසියම් ය. (5) පොස්පරස් ය.

36. වී වගාවේ, බෝග සංස්ථාපනයෙන් සති තුනකට පසු, මතුපිට යෙදීමක් ලෙස නයිට්‍රජන් පොහොර යෙදීමේ අරමුණ වනුයේ
(1) මූල පද්ධතියේ වර්ධනය වැඩි කිරීම ය. (2) ප්‍රෝටීන සංස්ලේෂණය වැඩි කිරීම ය.
(3) පත්‍රවල ප්‍රභාසංස්ලේෂණය වැඩි කිරීම ය. (4) පත්‍රවල නයිට්‍රජන් ප්‍රමාණය වැඩි කිරීම ය.
(5) බීජවලට ආහාර පරිසංක්‍රමණය වීම වැඩි කිරීම ය.

37. දෛහික සත්ත්ව සෛල මෙන් **නොව** ශාකවල සෛල පටක රෝපණය මගින් අලුත් ශාක පුනර්ජනනය කළ හැකි වන්නේ ශාක එක් එක් සෛලයක
A - සම්පූර්ණ ජාන කිට්ටුව අඩංගු වීම නිසා ය.
B - ප්‍රතිවිභේදනය වීමට ඇති හැකියාව නිසා ය.
C - පෙර ප්‍රකාශ **නොවූ** ජාන ප්‍රකාශ වීමට ඇති හැකියාව නිසා ය.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

38. වල් පැළෑටි වඩාත් හොඳින් අර්ථ දැක්විය හැක්කේ
(1) අනවශ්‍ය ස්ථානයක වැඩෙන හා බෝග නිෂ්පාදනයට බලපෑම් කරන ශාක ලෙස ය.
(2) මිනිසාගේ මැදිහත් වීමකින් තොරව වැඩෙන හා භූමියේ වටිනාකම අඩු කරන ශාක ලෙස ය.
(3) අනවශ්‍ය ස්ථානයක වැඩෙන හා මිනිස් අභිලාෂයන්ට අහිතකර බලපෑම් ඇති කරන ශාක ලෙස ය.
(4) ස්වභාවික ව වැඩෙන හා බෝගවල පරපෝෂිතයන් වෙමින් ඒවායේ අස්වැන්න අඩුකරන ශාක ලෙස ය.
(5) මිනිසාගේ මැදිහත් වීමකින් තොරව වැඩෙන හා බෝගවලට ඇලිලෝපතිතාව ඇතිකරන ශාක ලෙස ය.

39. ශ්‍රී ලංකාවේ *Eichhornia crassipes* ගහනය පාලනය කිරීමට යොදගත් ජෛව පාලක කාරකයා වනුයේ
(1) *Milabris pestulata* ය. (2) *Nilaparvata lugens* ය.
(3) *Neochetina bruchi* ය. (4) *Cyrtobagus salviniae* ය.
(5) *Paracoccus marginatus* ය.

40. පළිබෝධ පාලනය සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - පළිබෝධ නාශක යෙදීම නිසා පරිසරයේ සිටින ස්වාභාවික සතුරන්ගේ ගහනය වැඩි විය හැකි ය.
B - අධික ලෙස පොහොර භාවිතය පළිබෝධ පැතිරීම වැඩි කරයි.
C - පාරම්පරික පළිබෝධ පාලන ක්‍රම ප්‍රධාන වශයෙන් පළිබෝධකයන් තුරන් කිරීම අරමුණු කොට ගනී.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

41. සාර්ථක ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රමයක දී
(1) පළිබෝධ ප්‍රතිරෝධී බෝග ප්‍රභේද භාවිත කරයි.
(2) පළිබෝධ මර්දනයට පළිබෝධ නාශක භාවිත **නො කරයි.**
(3) බෝග මාරුව සිදු **නො කරයි.**
(4) සාම්ප්‍රදායික බෝග පාලන ක්‍රියා අනුගමනය කරයි.
(5) ස්වාභාවික සතුරන් කෘත්‍රිම ව බෝකර පරිසරයට මුදා හරී.

42. තෘණ ආහාරවල ඇති ප්‍රධාන ශක්ති ජනක පෝෂකය වනුයේ
(1) පිෂ්ටය ය. (2) ප්‍රෝටීන ය. (3) විටමින ය. (4) සෙලියුලෝස් ය. (5) මේද අම්ල ය.

43. ප්‍රෝටීන අනුපූරකවලට උදාහරණ වනුයේ
(1) බඩ ඉරිඟු, සහල් නිවුඩු සහ පොල්තෙල් ය.
(2) මෙතියොනින්, සිප්පි කටු සහ මාළු අන්නය ය.
(3) මාළු අන්නය, මස් අන්නය සහ අස්ථි අන්නය ය.
(4) බඩ ඉරිඟු, සෝයා බෝංචි අන්නය සහ පොල් පුන්නක්කු ය.
(5) සෝයා බෝංචි අන්නය, පොල් පුන්නක්කු සහ මාළු අන්නය ය.

44. කෘත්‍රිම බීජෞෂණයේ දී කිකිළි බිත්තර ඇසුරුම් කුටීරයේ (Setting compartment) සිට රක්කවන කුටීරයට (hatching compartment) මාරු කරනුයේ බීජෞෂණයේ
(1) 14 වන දින දී ය. (2) 16 වන දින දී ය. (3) 18 වන දින දී ය.
(4) 20 වන දින දී ය. (5) අන්තිම දින දී ය.

45. ගවයන්ගේ මද සමායෝජනය යොදා ගන්නේ
(1) ගබ්සා වීම අඩු කිරීමට ය.
(2) අවුරුද්දක කාලයක දී වැඩි පැටවුන් ප්‍රමාණයක් ලබා ගැනීමට ය.
(3) දෙනුන් එකම කාලයක දී නිෂ්පාදනයට ගෙන ඒමට ය.
(4) කෘත්‍රිම සිංචනය වඩාත් සාර්ථක ව සිදු කිරීමට ය.
(5) වසර පුරා ඒකාකාර නිෂ්පාදනයක් ලබා ගැනීමට ය.

46. හරිතාගාර කෘෂිකර්මය පිළිබඳ ප්‍රකාශ හතරක් පහත දැක් වේ.
A - එය බෝගවල ගුණාත්මය සහ සංගතතාව වැඩි කරයි.
B - එය භූමි හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩි කරයි.
C - එය රසායන ද්‍රව්‍ය හා පළිබෝධ නාශක භාවිතය වැඩි කරයි.
D - එය බෝගවලට ඇති බාහිර සහ ජීව විද්‍යාත්මක තර්ජන අඩු කරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම ය.

● ප්‍රශ්න අංක 47 ට පිළිතුරු දීම සඳහා පහත රූපය භාවිත කරන්න.



47. ඉහත රූපයේ ඇති වගා ක්‍රමය වනුයේ
(1) ජලගත වගාව ය. (2) වාගත වගාව ය. (3) උස් පාත්ති ය.
(4) ඇලි සහ වැටි ය. (5) එල්ලන මලු ය.

48. භූමි අලංකරණ සැලසුම් සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දක්වේ.
A - දැනට ඇති ගස් හා පඳුරු, පාදක පිඹුරෙහි (Base plan) කොටස් **නො වේ.**
B - භූමි අලංකරණ සැලසුම් සකස් කිරීමේ දී සමතුලිතතාව, ඒකාග්‍රතාව සහ රිද්මය සලකා බලනු ලැබේ.
C - භූමි අලංකරණ සැලසුමක් සඳහා, වියදම, දේශගුණික තත්ත්වයන් හා පවුලේ ප්‍රමාණය යන සාධක බලපායි.
ඉහත ප්‍රකාශ වලින්
(1) A හා B නිවැරදි මුත් C සාවද්‍ය වේ. (2) A නිවැරදි මුත් B හා C සාවද්‍ය වේ.
(3) B හා C නිවැරදි මුත් A සාවද්‍ය වේ. (4) B නිවැරදි මුත් A හා C සාවද්‍ය වේ.
(5) C නිවැරදි මුත් A හා B සාවද්‍ය වේ.

49. එස්පාලියර් ක්‍රමයේ දී බහුලව භාවිතකරන ශාක වනුයේ
(1) පත්‍රික ශාක ය. (2) විසිතුරු ශාක ය.
(3) බහු වාර්ෂික පලතුරු ශාක ය. (4) වාර්ෂික පුෂ්පීය ශාක ය.
(5) ද්වි වාර්ෂික සිහින් කඳක් සහිත ශාක ය.

50. ශ්‍රී ලංකාවේ කැපූ මල් කර්මාන්තය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A - රෝස මල් නිෂ්පාදනය කානේෂන් මල් නිෂ්පාදනයට දෙවෙනි වන අතර විවිධ හේතු නිසා එය සීමාකාරී වී තිබේ.
B - රෝස නිෂ්පාදනය සඳහා ඉතා සුවිශේෂී තත්ත්ව අවශ්‍ය වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් A හා B දෙකම
(1) අසත්‍ය වේ.
(2) සත්‍ය වන අතර A ප්‍රකාශය B මගින් විස්තර **නො කරයි.**
(3) සත්‍ය වන අතර B ප්‍රකාශය A මගින් විස්තර **නො කරයි.**
(4) සත්‍ය වන අතර A ප්‍රකාශය තවදුරටත් B ප්‍රකාශය මගින් විස්තර කරයි.
(5) සත්‍ය වන අතර B ප්‍රකාශය තවදුරටත් A ප්‍රකාශය මගින් විස්තර කරයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

18 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය :..............................

වැදගත් :
* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **07** කින් යුක්ත වේ.
* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** සහ **C** යන කොටස් **තුනකින්** යුක්ත වේ. කොටස් **තුනට ම** නියමිත කාලය **පැය තුනකි.** (ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නො ලැබේ.)

A කොටස - ව්‍යුහගත රචනා (පිටු 06 කි.)

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නොවන** බව ද සලකන්න.

B කොටස සහ C කොටස - රචනා (පිටු 01 කි.)

එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු "A", "B" සහ "C" කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ "A" කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.

ප්‍රශ්න පත්‍රයේ "B" හා "C" කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යා හැකි ය.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

දෙවැනි පත්‍රය සඳහා		
කොටස	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
A	1	
	2	
	3	
	4	
B	5	
	6	
	7	
C	8	
	9	
	10	
එකතුව		
ප්‍රතිශතය		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

සංකේත අංක

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	1.
	2.
අධීක්ෂණය	

[දෙවෙනි පිටුව බලන්න.

මේ තීරයේ කිසිවක් නො ලියන්න. මෙය පරීක්ෂකවරුන් සඳහා පමණි.

A කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

1. (A) ප්‍රශ්න (i) සිට (ii) තෙක් පිළිතුරු දීම සඳහා පහත රූපසටහන යොදා ගන්න.



(i) ඉහත උදුනේ ප්‍රධාන වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(ii) ඉහත උදුනේ දක්නට ලැබෙන පරිසර සංරක්ෂණය හා සම්බන්ධ **ප්‍රධාන අවාසිය** කුමක් ද?

....

(B) වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වෙළඳපොළ අවශ්‍යතා හඳුනාගැනීමට යොදා ගත හැකි තොරතුරු ප්‍රභවයන් **තුනක්** සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

(C) ශ්‍රී ලාංකික දරුවන් අතර බහුලව දක්නට ලැබෙන විටමින ඌනතා **දෙකක්** ලැයිස්තු ගත කර එම එක් එක් ඌනතාවක් මගහරවා ගැනීම සඳහා භාවිත කළ හැකි ආහාර ප්‍රභවයක් බැගින් නම් කරන්න.

	විටමින් ඌනතාව	**ආහාර ප්‍රභවය**
1.	....	....
2.	....	....

(D) ආහාරයක ඇති, කුණුවීම හේතු කොට ගෙන වෙනස් වන්නා වූ භෞතික ගුණාංග **හතරක්** ලැයිස්තු ගත කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(E) ගෘහස්ත ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ මාර්ග **දෙකක්** ලැයිස්තු ගත කරන්න.

1. ....

2. ....

(F) පහත වචන අර්ථ දක්වන්න.

(i) පාංශු ව්‍යුහය

....

....

(ii) පසේ කැටායන හුවමාරු ධාරිතාව (CEC)

....

....

[තුන්වෙනි පිටුව බලන්න.

මේ තීරයේ කිසිවක් නො ලියන්න. මෙය පරීක්ෂකවරුන් සඳහා පමණි.

(iii) ස්ථිර මැලවුම් අංකය

....

....

(G) ඩිම්බ කෝෂයේ කොටස් හා එම කොටස්වලින් වර්ධනය වූ පටක සමග ගැලපීම සඳහා අදාළ ඉංග්‍රීසි අකුර දී ඇති ඉඩකඩෙහි ලියන්න.

ඩිම්බකෝෂයේ කොටස		ඵලයේ පටකය
(i) ඵලාවරණය	....	a. බීජාවරණය
(ii) යුක්තාණුව	....	b. භ්‍රෑණපෝෂය
(iii) ඩිම්බ වෘන්තය	....	c. ඵලය
(iv) සිවිය	....	d. බීජලපය
(v) ඩිම්බය	....	e. කලලය
(vi) ත්‍රිගුණ සෛලය	....	f. බීජය

(H) පහත වචන නිර්වචනය කරන්න.

(i) විසංයෝගතාව

....

....

(ii) පාතෙනොඵලනය

....

....

2. (A) ආයුර්වේද ඖෂධ සැකසීමේ දී ඖෂධ ශාකවල විවිධ කොටස් උපයෝගී කරගනු ලැබේ. පහත ශාකවල, ආයුර්වේදයේ දී යොදා ගනු ලබන වඩාත් වැදගත් ශාක කොටස සඳහන් කරන්න.

ඖෂධ ශාකයේ නම	ඖෂධ සඳහා යොදා ගන්නා කොටස
(i) නෙල්ලි (*Phyllanthus emblica*)	....
(ii) එරඬු (*Ricinus communis*)	....
(iii) රණවරා (*Cassia auriculata*)	....
(iv) ඉඟුරු (*Zingiber offcinale*)	....
(v) මූනමල් (*Mimusops elangi*)	....
(vi) පාවට්ටා (*Pavetta indica*)	....

(B) මුහුදෙන් ලබා ගන්නා වැදගත් **ජීවී නො වන** සම්පත් **දෙකක්** ලියන්න.

1. ....
2. ....

(C) පැපොල්වල පසු අස්වනු හානි අවම කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග **තුනක්** ලැයිස්තු ගත කරන්න.

1. ....
2. ....
3. ....

(D) ජෛවතාක්ෂණයේ නූතන භාවිතාවන් **දෙකක්** සඳහන් කරන්න.

1. ....
2. ....

[හතරවෙනි පිටුව බලන්න.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න. මෙය පරීක්ෂකවරුන් සඳහා පමණි.

(E) නාගරික නිවාස සංකීර්ණයක වාසය කරන්නා වූ නිවැසියන්ට ලබාදිය යුතු භාණ්ඩ හා සේවාවන් **හයක්** සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

5. ....

6. ....

(F) නාගරික නිවාස සංකීර්ණයක පිහිටා ඇති සිල්ලර බඩු කඩයක විකිණිය යුතු භාණ්ඩ තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(G) කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සමග වැඩ කිරීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂණ ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(H) පහත ද නිර්වචනය කරන්න.

(i) ජීව විද්‍යාත්මක ඔක්සිජන් ඉල්ලුම (BOD)

....

....

(ii) රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD)

....

....

3. (A) නූතන කෘෂි තාක්ෂණය සතු ව බොහෝ යහගුණ මෙන් ම අවගුණ ද ඇත. ශ්‍රී ලංකාව තුළ නූතන කෘෂි තාක්ෂණය ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දීමට සිදුවන සීමාකාරී සාධක **දෙකක්** ලැයිස්තු ගත කරන්න.

1. ....

2. ....

(B) කෘෂි කර්මාන්තයේ දී යන්ත්‍ර සූත්‍ර භාවිතය, එහි ඵලදායිතාව වැඩි කිරීමට උපකාරී වේ.

(i) ප්‍රාථමික බිම සැකසීමේ දී යොදා ගන්නා ට්‍රැක්ටර් මත නැංවූ උපකරණ **දෙකක්** ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

(ii) අතුරුයත්ගෑමේ දී යොදා ගන්නා නූතන තාක්ෂණික උපකරණ **දෙකක්** ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

(C) හිමිකමක් **නොමැති ව** ඉඩම් භුක්ති විඳීම, භූමි හායනය සිදුවන ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත.

(i) හිමිකමක් **නොමැති ව** ඉඩම් භුක්ති විඳීම භූමි හායනයට බලපාන්නේ කෙසේදැයි දක්වීමට කරුණු **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(ii) භූමි හායනයට බලපාන වෙනත් හේතු **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

[පස්වෙනි පිටුව බලන්න.

මේ තීරයේ කිසිවක් නො ලියන්න. මෙය පරීක්ෂකවරුන් සඳහා පමණි.

(D) ශාක පෝෂක 16 න්, 13 ක් ම ශාක සාමාන්‍යයෙන් ලබා ගන්නේ පසෙනි. මෙම පෝෂක පසට සැපයෙන්නේ පොහොර මගිනි.

(i) කෘෂි භූමිවලට පොහොර ලෙස අපරිණත කොම්පෝස්ට් යෙදීමේ **අවාසි දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(ii) වී වගා ක්ෂේත්‍රයකට කාබනික පොහොර සමග අකාබනික පොහොර එකතු කර යෙදීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(E) සමහර ශාකවල, කාබන් තිර කිරීමේ C_4 පථය දක්නට ඇත. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ යල කන්නයේ දී C_3 බෝගවලට සාපේක්ෂව C_4 බෝග වගා කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ....

2. ....

(F) පවත්නා ශාකයකින් විසංගමනය කළ සෛලවලට නව ශාක ලෙස වැඩීමේ විභවතාවක් ඇත.

(i) පටක රෝපණයේ දී ප්‍රරෝහ බිහි කිරීම සඳහා බහුලව යොදා ගන්නා වර්ධක යාමකය නම් කරන්න.

....

(ii) පටක රෝපණයේ දී මුල් ඇද්දවීම සඳහා බහුලව යොදා ගන්නා වර්ධක යාමකය නම් කරන්න.

....

(iii) පටක රෝපණය මගින් ශාක ප්‍රචාරණය කිරීමේ වාසි **දෙකක්** ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

(G) කුකුළු ආහාර සෑදීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය පහක් පහත දැක්වේ. මෙම සංඝටක ශක්ති හෝ ප්‍රෝටීන් පරිපූරකදැයි සඳහන් කර ඒවායේ ඇති දළ ප්‍රෝටීන් ප්‍රමාණය ආසන්න වශයෙන් දක්වන්න.

අමුද්‍රව්‍ය	**පරිපූරක ආකාරය** (ශක්ති හෝ ප්‍රෝටීන්)	**ආසන්න වශයෙන් දළ ප්‍රෝටීන් ප්‍රමාණය**
(i) බඩ ඉරිඟු අන්නය	....	....
(ii) පොල් පුන්නක්කු	....	....
(iii) සෝයා බෝංචි අන්නය	....	....
(iv) සහල් නිවුඩු	....	....
(v) මාළු අන්නය	....	....

4. (A) කෘෂිකාර්මික නිෂ්පාදනවල ගුණාත්මය මෙන් ම ප්‍රමාණය වැඩිකිරීමට පළිබෝධ කළමනාකරණය වැදගත් වේ.

(i) "ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය" යනු කුමක් ද?

....

....

....

(ii) කෘෂිකාර්මික බෝගයක් සඳහා පළිබෝධනාශක යෙදීමේ දී පූර්ව අස්වනු නෙලන කාලාන්තරයක් පවත්වා ගත යුත්තේ මන්දැයි සඳහන් කරන්න.

....

....

....

මේ තීරයේ කිසිවක් නො ලියන්න. මෙය පරීක්ෂකවරුන් සඳහා පමණි.

(iii) පහත වචන අර්ථ දක්වන්න.

1. ස්පර්ශ වල්නාශක

....

....

....

2. සංස්ථානික වල්නාශක

....

....

....

(iv) කෘමි පළිබෝධ පාලනය සඳහා රසායනික පළිබෝධනාශක යොදගැනීමේ අවාසි **හතරක්** ලැයිස්තු ගත කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(B) කිකිළි බිත්තර ස්වාභාවික ලෙස රැක්කවීමේ වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(i) **වාසි**

1. ....
2. ....

(ii) **අවාසි**

1. ....
2. ....

(C) කෘත්‍රිම සිංචනය සඳහා ගව ශුක්‍රාණු එකතු කර, පරීක්ෂා කර සංරක්ෂණය කළයුතු වේ. ආලෝක අන්වීක්ෂය යටතේ නිරීක්ෂණය කළ හැකි, ශුක්‍රාණුවල දකිය හැකි ලක්ෂණ **දෙකක්** ලැයිස්තුගත කරන්න.

1. ....
2. ....

(D) කුකුළු මස්වලින් සාදනු ලබන අගය එකතු කළ නිෂ්පාදන **දෙකක්** නම් කරන්න.

1. ....
2. ....

(E) වාරි කාර්යක්ෂමතාව ප්‍රධාන වශයෙන් ජලය ගෙන යාමේ දී සිදුවන හානිය මත රඳා පවතී. වාරි ජලය ගෙනයාමේ දී ජල හානි වන ආකාර **තුනක්** සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....

(F) පාලිත පාරිසරික තත්ත්ව යටතේ බෝග වගා කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වෙමින් පවතී. පාලිත පාරිසරක තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ වාසි **තුනක්** සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....

(G) ගෘහස්ත ව වගා කරන ශාක තේරීමේ දී සලකා බලනු ලබන ලක්ෂණ **තුනක්** ලැයිස්තු ගත කරන්න.

1. ....
2. ....
3. ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

18 S II

රචනා

* **B** සහ **C** යන කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් ලැබේ.)

B කොටස

5. (i) අසමතුලිත පෝෂණය නිසා රෝගී ජීවිතයකට මග පෑදෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
   (ii) කෘෂිකර්මය පදනම් වූ රටක් වශයෙන්, ජාතික මට්ටමේ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය මැදිහත් විය යුත්තේ කෙසේදැයි විස්තර කරන්න.
   (iii) බීජ මගින් ප්‍රචාරණයේ හා වර්ධක ප්‍රචාරණයේ වාසි හා අවාසි විස්තර කරන්න.

6. (i) ආහාරවල ජෛව විද්‍යාත්මක කුණුවීමට සෘජුව බලපෑ හැකි සාධක විස්තර කරන්න.
   (ii) ව්‍යවසායක සාර්ථකත්වයට කළමනාකරණය බලපාන්නේ කෙසේදැයි විස්තර කරන්න.
   (iii) බෝග වර්ධනය කෙරෙහි පාංශු භෞතික ගුණාංගවල බලපෑම පැහැදිලි කරන්න.

7. (i) ඖෂධ උයනක් සඳහා ශාක තේරීමේ දී සලකා බැලිය යුතු සාධක පැහැදිලි කරන්න.
   (ii) මිනිසාගේ බලපෑම් හේතු කොටගෙන ජලජ පරිසර පද්ධති මුහුණ දෙන්නා වූ අභියෝග විස්තර කරන්න.
   (iii) කිරිවල පසු අස්වනු හානි අවම කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම විස්තර කරන්න.

C කොටස

8. (i) නම් කළ රූපසටහනක් ආධාරයෙන් නැප්සැක් ස්ප්‍රේයරයේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.
   (ii) පාංශු සුසංහනයට බලපාන සාධක හා එහි අහිතකර ප්‍රතිඵල පැහැදිලි කරන්න.
   (iii) කාබනික පොහොර යෙදීම මගින් පසෙහි භෞතික හා රසායනික වෙනස්කම් සිදුවන්නේ කෙසේදැයි විස්තර කරන්න.

9. (i) පටක රෝපණය සඳහා අවශ්‍යවන විද්‍යාගාර අවශ්‍යතා විස්තර කරන්න.
   (ii) වී අස්වැන්න කෙරෙහි ශාක ඝනත්වය වැඩිවීම බලපාන ආකාරය පැහැදිලි කරන්න.
   (iii) මඩ වී ගොවිතැනෙහි වාර්ෂික තෘණ ශාක පාලනය සඳහා සුදුසු ඒකාබද්ධ වල්පැළ කළමනාකරණ වැඩසටහනක් විස්තර කරන්න.

10. (i) භූමි අලංකරණ සැලැස්මක දී මෘදු සංඝටක හා දෘඪ සංඝටක සම්මිශ්‍රණය කිරීමේ වැදගත්කම විස්තර කරන්න.
    (ii) තෘණ සංරක්ෂණ ක්‍රම ලෙස හේ (hey) සහ සයිලේජ් (silage) සෑදීමේ ක්‍රියාවලි විස්තර කරන්න.
    (iii) දෙනක් කෘත්‍රිම සිංචනයට භාජනය කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රධාන පියවර විස්තර කරන්න.

* * *

මෙතැනින් කපන්න